# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1695/26 – 2011 මාර්තු 04 වැනි සිකුරාදා – 2011.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිණියම කෝරලේ සුළු කොට්ඨාසයේ, විහාරගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ku/BNG/2010/268 හා 2010.09.16 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 2.0239ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි විහාරගම නමැති ඉඩම් කොටස:

**01. කැබලි අක්ෂර 'ඒ' – විහාරගම – ප්‍රමාණය: හෙක්. 2.0239ක් පමණ**
උතුරට සහ නැගෙනහිරට: බිංගිරිය දේවගිරි රජමහා විහාරය හිමිකම් කියන විහාරගම; දකුණට: වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු මාර්ගය; බටහිරට: බිංගිරිය දේවගිරි රජමහා විහාරය හිමිකම් කියන විහාරගම.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/4/2010/ඩබ්එස්/164.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: බිං/3/9/අත්/64.

2011 ජනවාරි මස 07 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 – 445